www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

### එක්සත් ජනපදය හා අනෙකුත් රටවල බාධා මධ්‍යයේ වුව,

# දේශගුනික වෙනස්වීම් පිලිබඳ වාර්තාව ගෝලීය උනුසුමේ බියකරු බලපෑම කැටි කොට දක්වයි

## Despite interference from US and other countries
## Climate change report outlines dire impact of global warming

**මාක් රේනර් විසිනි**
**2007 අප්‍රේල් 10**

දේශගුනික වෙනස්වීම් පිලිබඳ අන්තර්ආන්ඩු කමිටුව (අයිපීසීසී- Intergovernmental Panel on Climate Change) "දේශගුනික වෙනස්වීම්වල බලපෑම්, අනුවර්තනයන් සහ අවදානම" නම් තම වාර්තාව මත පදනම්ව, පසු ගිය අප්‍රේල් 6 දා, ක්‍රියාකාරී කමිටුව II හි සාරාංශය ප්‍රතිපත්ති සකසන්නන් සඳහා නිකුත් කලේ ය.

1988 දී එක්සත් ජාතීන් විසින් ස්ථාපනය කරන ලද ලොව පුරා සිටින විද්‍යාඥයින්ගේ අදහස් ගෙන එන ආයතනයක් වන අයිපීසීසී ය විසින් නිකුත් කල වාර්තාව මගින් නියඟයන්, නැගෙන මුහුදු මට්ටම්, ගංවතුර, ශාක සහ සත්ත්ව ජීවිතවල මහා පරිමාන අභාවයන් හා විශාල පරිමාන මන්දපෝෂනයේ හා රෝගයන්ගේ තීව්‍ර වීමක් ගෝලීය උනුසුම විසින් ඇති කරනු ඇතැයි ප්‍රකාශ කෙරේ. වඩාත් දරුනු බලපෑම දිලින්දන් මත වනු ඇති අතර ගෝලීය උනුසුම ජාත්‍යන්තරව මිලියන සියගනන් ජනතාවගේ ජීවිත මත ව්‍යසනකාරී ලෙස බලපානු ඇත.

කොටස් තුනකින් සමන්විත දේශගුන වෙනස්වීම් පිලිබඳ අයිපීසීසී වාර්තාවේ දෙවන කොටසේ එන, සිකුරාදා නිකුත් කරන ලද සාරාංශය මානව හා ස්වාභාවික පද්ධතීන් මත දේශගුන වෙනස්වීමේ බලපෑම පිලිබඳව අදහස් දක්වයි. දේශගුනය වෙනස්වීමේ භෞතික විද්‍යාත්මක පදනම විභාග කරන ලද 2007 පෙබරවාරියේ නිකුත් කල ප්‍රථම කොටස උනුසුම්වීම සත්‍යයක් බව සහ "බොහෝ කොට ම" මානවයන් විසින් ඇති කරන ලද බව සොයාගනී. තෙවන කොටස මගින් ගෝලීය උනුසුම නැවැත්විය හැකි සහ ආපසු හැරවිය හැකි ක්‍රමෝපායන් පිලිබඳව විභාග කිරීමට නියමිත ය. සම්පූර්න වාර්තාව මේ වසරේ පසු භාගයේ නිකුත් කෙරෙනු ඇත.

වාර්තාව සැකසූ ප්‍රධාන විද්‍යාඥයන් හා ජාතික ආන්ඩු නියෝජනය කරන රාජ්‍ය තාන්ත්‍රිකයන් අතර ආතති සහගත අරගල මධ්‍යයේ පවා වාර්තාවේ සොයාගැනීම්වල බියකරු ස්වභාවය එලිමහනට පැමිනේ. *ඇසෝසියේටඩ් ප්‍රෙස්හි* පලවූ වාර්තාවකට අනුව "උෂ්නත්වය ඉහල යන සෑම අංශක 1.8 ක් පාසා ඇතිවන දේශගුන වෙනස්වීම් සහ ඒවායේ ව්‍යසනකාරී බලපෑම මතුකොට දක්වන මූලික වගුවක කොටස් නියෝජිතයන් විසින් ඉවත් කරනු ලැබීම හා ප්‍රධාන ප්‍රකාශයන්ගේ මූලික ඇමිනුම් වල විද්‍යාත්මක විශ්වාසවන්තභාවය පිලිබඳව ඇති වූ කලහයක් හේතුවෙන් දින 5ක සාකච්ඡා කූටප්‍රප්තියකට ලඟා විය."

"වඩාත් බියකරු ප්‍රක්ෂේපනයන්ගෙන් සමහරක අවධාරනයේ නිශ්චිතභාවය දියකර හැරීමේ මාවත් නිරන්තරයෙන් සොයමින් එක්සත් ජනපදය, චීනය සහ සවුදි අරාබිය ප්‍රකාශන ශෛලීන්ට එරෙහිව විරෝධතාවන් බොහොමයක් මතු කලහ"යි *ඇසෝසියේටඩ් ප්‍රෙස්* වාර්තා කලේ ය. මෙයට එරෙහි වෙමින් "ඇමරිකානු ඔක්ලහෝමා සරසවියේ විද්‍යාඥ ඩේවිඩ් කැරෝලි ද ඇතුලත් ප්‍රධාන විද්‍යාඥ-කතුවරු තිදෙනෙක් රාජ්‍යතාන්ත්‍රිකයන් සිදු කරන වෙනස්කම්වලට නෛතික විරුද්ධත්වය පලකලහ. විද්‍යාඥයෝ කියා සිටියේ එය වනාහි පසු ගිය මාස ගනන තිස්සේ වාර්තාව බෙදා හරිනු ලබනවිට මතු නොවුනු වර්ගයේ විද්‍යාත්මක විස්වාසවන්තභාවයේ පෙර නුවූ විරු දූර්වල වීමක් බවයි."

වාර්තාවේ සොයාගැනීම් දුර්වල කිරීමට දරන ලද උත්සාහයට නායකත්වය දෙන ලද බව පෙනෙන්නේ එක්සත් ජනපදයයි. *වොෂින්ටන් පෝස්ට්* පුවත්පතට අනුව "හරිතාගාර වායු පිටකිරීම කප්පාදු කිරීමට ආයාචනා කල එක් කොටසක භාෂාව කපා කොටා සකස් කිරීමට එක්සත් ජනපද සාකච්ඡාකරුවෝ සමත් වූ බව" කොලොරාඩෝහි බුල්ඩර්වල පිහිටි වායුගෝලීය පර්යේෂන පිලිබඳ ජාතික මධ්‍යස්ථානයේ විද්‍යාඥවරියක් හා වාර්තාවේ එක් ප්‍රධාන කතුවරියක් වන පැට්‍රීෂියා රෝමිරෝ ලැන්කාවෝ පැවසුවා ය.

*ඇසෝෂියේටඩ් ප්‍රෙස්* පෙන්වා දෙන පරිදි වාර්තාවට කරන ලද සංශෝධන අතර, දේශගුන වෙනස්කම් මගින් ස්වාභාවික පද්ධතීන් මත ඇති කරන

බලපෑම තහවුරු කරන ප්‍රකාශයක් පලමුව සංශෝධනය කිරීම ද ඉන් පසුව "ඉතා ඉහල විශ්වාසවන්තභාවය" යන යෙදුම ඉවත් කිරීම ද ඇතුලත් ය. ගං වතුර මගින් "මිලියන සිය ගනනක්" මත බලපෑම් ඇති කෙරෙන බව නිගමනය කල ප්‍රකාශයක් "මිලියන බොහෝ ගනනක්" යන්නට ලඝු කෙරුනි. තවද ගෝලීය උනුසුම නිසා මිලියන 120ක ජනතාවක් සාගින්නේ අවදානමට මුහුන දෙනු ඇති බව සඳහන් ප්‍රකාශයක් සම්පූර්නයෙන් ඉවත් කරනු ලැබිනි.

ආන්ඩුවේ දේශගුනික පර්යේශනවලට බුෂ් පරිපාලනයේ දේශපාලන බාධා කිරීම් සහිතව එක්සත් ජනපදය තුල සිදුවන වර්ධනයන් සමග අයිපීසීසීයේ තක්සේරුව දියාරු කිරීමට යොදන පීඩනය සමාන්තර වේ. ආන්ඩුවේ විද්‍යාඥයින්හට තමන්ගේ කෘති තුල දේශගුන වෙනස්වීම් පිලිබඳ සඳහන් කරන කොටස් ඉවත් කරන ලෙස හෝ ගෝලීය උනුසුමේ ප්‍රතිඵල හා භව්‍යතාවන් පිලිබඳව ඔවුන් එලැඹ ඇති නිගමනවල ඍජු භාවය අඩු කිරීමට පීඩනය යොදන බවට ගිනිය නොහැකි තරම් වාර්තා පවතී.

දින හතරක් පැවති සාකච්ඡාවල දී එක්සත් ජනපද නියෝජිත කන්ඩායම යෝජනා කල සංශෝධන කවරේ ද යනුවෙන් සාරාංශ වාර්තාව පිලිබඳ ජනමාධ්‍ය හමුවේ දී යලි යලිත් ඉස්මතු කෙරුනු ප්‍රශ්නකිරීම්වලට පිලිතුරු දීමෙන් ධවල මන්දිර විද්‍යා හා තාක්ෂන ප්‍රතිපත්ති කාර්යාලයේ ෂැරොන් හේස් වැලකී සිටියේ ය. ඒ අතර ම පාරිසරික ගුනාත්මක භාවය පිලිබඳ ධවල මන්දිර කවුන්සිලයේ සභාපති ජේම්ස් කොනෝටන් "ප්‍රතිචක්‍රීය ඉන්ධන" මගින් පිරිපහදු ඉන්ධන විස්ථාපනය කිරීමේ බුෂ්ගේ යෝජනාව " සැලකිය යුතු ලෙස හරිතාගාර වායු විමෝචනය අඩු කරන්නා වූ අනිවාර්ය ආරක්ෂකයක්" ලෙස හුවාදක්වීමේ උත්සාහයක යෙදුනි.

බුෂ් පරිපාලනයේ ආරූඪවීම දේශගුනික වෙනස්වීම් හා එහි බලපෑම පිලිබඳ වැඩෙන විද්‍යාත්මක සාක්ෂ්‍ය බහුතර මහජනයාගේ පිලි ගැනීමට ලක් වීම සම්බන්ධයෙන් දක්වන ප්‍රතිචාරයකි. එහෙත් බුෂ් පරිපාලනයේ ආස්ථානය පෙන්නුම් කරන්නේ එක්සත් ජනපද ආන්ඩුවේ ප්‍රතිපත්තිවල වෙනසක් නොවනු ඇති බවයි.

මිලියන ගනන් ජනතාවගේ සෞඛ්‍යයට බලපෑම් ඇති කිරීමට දේශගුනික වෙනස්වීම් හේතුවන බව සාරාංශ වාර්තාව පෙන්වා දෙයි: වර්ධනය වන මන්ද පෝෂනය, වැඩිවන පාචනය, "අධික උෂ්නත්වය, ගං වතුර, කුනාටු, ගිනි හා නියං හේතුවෙන් ඇතිවන ඉහල යන මරන, රෝග හා තුවාලවීම්" සහ "පොලව මට්ටමේ ඕසෝන් සාන්ද්‍රනය වැඩිවීම නිසා හෘද ශ්වසන රෝගවල සංඛ්‍යාව වැඩිවීම" එහි පල විපාක වනු ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධාන විශේෂඥවරියක හා සෞඛ්‍ය පිලිබඳ පරිච්ඡේදයේ එක් ප්‍රධාන කතුවරියක වන බෙටිනා මෙන්, මන්දපෝෂනය හා පාචනය හේතුවෙන් 2000 වසරේ පමනක් ඇති වූ මරනවලින් 150,000ක් ම දේශගුන වෙනස්වීම්වලට ආරෝපනය කල හැකි බව කීවා ය.

1970 පටන් එක් රැස් කරන ලද දත්ත කුලක 29,000 ට වැඩි ප්‍රමානයක් ගෙන හැර පාන අයිපීසීසීයේ සම්පූර්න වාර්තාව දේශගුනික වෙනස්වීම්වල ගෝලීය ධාරාවන් පෙන්නුම් කරයි. සාරාංශය සාමාන්‍ය ධාරාවන් කැටිකොට දක්වන නමුත් දේශගුනික වෙනස්වීම් මේ වන විටත් මානව හා ස්වාභාවික පද්ධතීන් මත ඇති කර ඇති බලපෑම් පිලිබඳව සැලකිය යුතු සටහන් හෝ විස්තර ඉදිරිපත් කරයි.

ලෝකයේ විවිධ කලාප සඳහා ප්‍රක්ෂේපනයන් සමගින් අනාගතයේ ඇතිවිය හැකි බලපෑම් පිලිබඳව අනාවැකි අඩංගු කරගන්නා සාරාංශ වාර්තාව ගෝලීය උනුසුම ඉහල යාම නිසා ජලය, පරිසර පද්ධති, ආහාර, මුහුදු වෙරල හා මානව සෞඛ්‍ය මත ඇති වෙතැයි බලාපොරොත්තු වන බලපෑම් පෙන්වන වගු සටහනකින් ද යුක්ත වේ.

සෙල්සියස් අංශක 1.5 සිට 2.5 දක්වා හෝ එය ඉක්මවන උෂ්නත්ව නැග්මක්, පාරිසරික පද්ධති ව්‍යුහයට හා ක්‍රියාකාරිත්වයට ප්‍රධාන වෙනස්කම් ඇති කරමින්, යෝධ ශාඛ හා සත්ත්ව විශේෂයන්ගෙන් 20% සිට 30% දක්වා පරිමානයක් විනාශයට යාමේ අනතුරට හෙලනු ඇතැයි බලාපොරොත්තු වේ. ප්‍රතිඵලය වනු ඇත්තේ ජෛව විවිධත්වයට හා ජලය හා ආහාර සැපයුම යනාදී පාරිසරික පද්ධතිමය භාන්ඩ හා සේවා වලට මුඛ්‍ය ලෙස ඍනාත්මක බලපෑම් ඇති කරනු ඇතැ" යි වාර්තාව පෙන්වා දෙයි.

දේශගුනික විචලතාවන්ට හා වෙනස්වීම්වලට වැඩියෙන් ගොදුරුවන මහාද්වීපවලින් එකක් වන්නේ අප්‍රිකාව" යයි වාර්තාව ප්‍රකාශ කරයි. 2020 වන විට අප්‍රිකාවේ "මිලියන 75ත් 250ත් අතර ජනතාවක් ජල ආතතියට නිරාවරනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ." සමහර අප්‍රිකානු රටවල ජල පෝෂිත කෘෂිකාර්මික නිෂ්පාදන "2020 වන විට 50% දක්වා පමන ප්‍රමානයකින් අඩුවී" කෘෂිකාර්මික නිෂ්පාදනය මත බලපෑම් ඇතිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. "මෙය තව දුරටත් ආහාර රක්ෂනය මත සංඛ්‍යාත්මක ලෙස බලපා මහාද්වීපය තුල මන්දපෝෂනය උග්‍ර කරනු ඇත" යි වාර්තාව නිගමනය කරයි.

ආසියාවේ පිරිසිදු ජලය අඩුවීම සමගින් " ජනගහන වර්ධනය හා ඉහල ජීවන තත්වයන්ගෙන් ඇතිවන වැඩිවන ඉල්ලුම 2050 නන් වන විට මිලියනයක් ජනතාව මත අහිතකර ලෙස බලපානු ඇත." ප්‍රමුඛව ම කුඩා දූපත්වල ද අප්‍රිකාවේ හා

ආසියාවේ වෙරලබඩ ප්‍රදේශවල ද ජීවත්වන ජනයා ඇතුලත් " තවත් බොහෝ මිලියන ගනනක් 2080 ගනන් වන විට මුහුදු මට්ටම ඉහල යාම නිසා අවුරුදු පතා ගං වතුරට ගොදුරු වේ යයි ප්‍රක්ෂේපනය කරනු ලැබේ." යයි වාර්තාව කියා සිටියි.

ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ ගැඹුරු ජල ආරක්ෂක ගැටලු, "ජෛව විවිධත්වයේ සැලකිය යුතු අඩු වී යාමක්", ජනගහන වර්ධනයක් අත් දකිමින් සිටින වෙරලබඩ ප්‍රදේශවල මුහුදු මට්ටම් ඉහල යාම් හා කුනාටු තර්ජනයක් හා අනෙකුත් ප්‍රදේශවල කෘෂිකාර්මික නිෂ්පාදනයේ ඉහලයාමත් සමගින් සමහර ප්‍රදේශවල අඩුවීමක් සිදුවනු ඇතැයි වාර්තාව ප්‍රක්ෂේපනය කරයි.

යුරෝපය නිරන්තරයෙන් ග්ලැසියර ඛාදනයේ, ක්ෂනික ගං වතුරේ, අධික උෂ්නත්වයේ හා නියඟයේ තර්ජන අත් දකිනු ඇත. ලතින් ඇමරිකාවේ දේශගුනික වෙනස්වීම් නිවර්තන වනාන්තරවල අඩුවීයාම, කෘෂිකාර්මික සහ සත්ව නිෂ්පාදන ඵලදායිතාවයේ අඩුවීමක් හා ජල සම්පත්වල හිඟයත් සමගින් " කෘෂිකාර්මික ඉඩම්වල ලවන සාන්ද්‍රනය ඉහල දමමින් ඒවා නිසරු කිරීම" දක්වා ධාවනය වනු ඇත.

අනෙකුත් ප්‍රතිඵල ද සමගින් ඉහල යන නිවර්තන කුනාටුවලට මුහුන දීමට උතුරු ඇමරිකාවට සිදු වනු ඇත. "ආන්තික කාලගුනික සිද්ධීන් වඩා ප්‍රබල සහ/ හෝ නිරන්තරව සිදු වීමක් බවට පත් වූ විට එම සිද්ධීන්ගේ ආර්ථික හා සමාජීය පාඩුව ඉහල යනු ඇත" යි වාර්තාව සටහන් කරයි. ගෝලීය උනුසුම ඉහල යාම සමග 2005 දී නිව් ඕර්ලියන්ස් ප්‍රදේශය සමූලෝත්පාඨනය කල කත්‍රිනා වර්ගයේ මහා කුනාටුවල ශක්තියේ හා පැවතීමේ ඉහල යාමක් ඇති වෙතැයි බොහෝ විද්‍යාඥයෝ අනාවැකි පලකරති.

අවසාන වසයෙන් ධ්‍රැවීය කලාප දිගට ම ග්ලැසියර දියවී යාමට මුහුන පානු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර කුඩා දූපත් ඉහල යන ජල මට්ටම් මගින් තර්ජනයට ලක් කෙරෙනු ඇත.

"සීමිත අනුවර්තන හැකියාවන්" හා "ප්‍රාදේශීය ජලය හා ආහාර සැපයුම් වැනි දේශගුන සංවේදී සම්පත් මත වඩ වඩා රඳා පැවැත්ම" හේතුවෙන් "දිලිඳු ප්‍රජාවන් වඩාත් අනාරක්ෂිත වන" බව වාර්තාව විස්තර කරයි. අයිපීසීසී සභාපති රාජේන්ද්‍ර පචවුරි අයිපීසීසී මාධ්‍ය හමුවේ දී සංක්ෂිප්ත කොට දක්වූ පරිදි "නරකම ගොදුරු බවට පත් වනු ඇත්තේ සෞභාග්‍යමත් සමාජයන්වල දිලින්දන් ද ඇතුලත් දිලින්දන්ගෙන් ද දිලිඳුතම ජනයා යි."

© www.wsws.org